# <u>නිවේදනය</u>

## <u>උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ආදායම් පරික්ෂක III ශ්‍රේණියේ තනතුරු සඳහා විවෘත පදනමින් බඳවා ගැනීම - 2026</u>

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ආදායම් පරික්ෂක තනතුරේ පවතින පුරප්පාඩු 11 ක් පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති උතුරු මැද පළාත තුළ ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය .2026.08.17 වන අතර, බඳවා ගැනීමේ තරඟ විභාගය 2026 ඔක්තෝම්බර් මස අනුරාධපුර නගරයේ දී පැවැත්වේ.

පුරප්පාඩු සංඛ්‍යාව 11කි.

**01. බඳවා ගැනීමේ සුදුසුකම් :**

1.1 අධ්‍යාපන සුදුසුකම්:

1.1.1

(අ).සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය හා තවත් විෂයයන් තුනකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ ) විභාගයේදි අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරික්ෂණය හැර) සමත්ව තිබිම

1.1.2 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම උතුරු මැද පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරිමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරිමටත් ප්‍රමාණවත් ශාරිරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

1.1.2.1වෙනත් සුදුසුකම්

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර තුනක් (03) උතුරු මැද පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද සහතික ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතුය. (ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචි සහතිකය DS4 මඟින් සම්මුඛ පරික්ෂණ අවස්ථාවේදී පදිංචිය සනාථ කළ යුතුය. කලත්‍රයාගේ ස්ථිර පදිංචිය වුවද සලකා බැලේ)
IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම් සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

1.1.3 වයස් සීමාව

1.1.3.1.අවම සීමාව - අවුරුදු 18 - 30

( දැනටමත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු නිලධාරින්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ )

**02.**බඳවා ගැනීමේ ක්‍රමය **: විවෘත තරග විභාගය**

2.1 සටහන

2.1.1 ලිඛිත විභාගය - ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගයෙන් විෂයයන් දෙකම සමත් අයදුම්කරුවන් විසින් ලබාගත් ලකුණුවල කුසලතාව අනුව පවතින පුරප්පාඩු ගණනට සමාන පිරිසක් බඳවා ගනු ලැබේ.

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 02 භාෂා හැකියාව | පැය 01 | 100 | 40% |

(විෂය නිර්දේශය උපලේඛන/ඇමුණුම 01 හි දැක්වේ)

2.1.2 විභාගය පවත්වන බලධාරියා : උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2.1.3 මෙම විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ. අයදුම්පත සකස් කළ යුත්තේ තම විභාගයට පෙනී සිටින මාධ්‍යයෙනි.

2.2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

2.2.1 ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු , අයදුම්කරුගේ බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කිරිම.

2.2.2 සාමාන්‍ය සම්මුඛ පරික්ෂණය : සම්මුඛ පරික්ෂණයේදි අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පරික්ෂා කරනු ලැබේ.

සටහන : ලිඛිත පරික්ෂණයේදී ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරික්ෂණයකට කැඳවා සුදුසුකම් පරික්ෂා කිරිමෙන් අනතුරුව සුදුසුකම් ලැබුවන් තනතුරට බඳවා ගනු ලැබේ.

**03.**වැටුප

3.1 වැටුප් කේත අංකය : MN 1 – 2025

3.2 වැටුප් ක්‍රමය/ පරිමාණය : රු. 45230-10×540-11×630-10×890-10×1190-78360/=

**04.අයදුම් කිරිමේ ක්‍රමය**

4.1 ඉල්ලුම් පත්‍රය A4 (සෙ.මී. 21x25) ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගෙන සකස් කල යුතුය. අදාල තොරතුරු ස්වකීය අත්අකුරුවලින්ම පැහැදිළිව සම්පූර්ණ කළ යුතු වේ. (ඉල්ලුම් පත්‍රයේ පිටපතක් තමා භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

4.2 නියමිත ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන, අසම්පූර්ණ හා තනතුරට අදාළ සියලු සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත්, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දිමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.3 ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපත් භාරගනු නොලැබේ. .(ඉල්ලුම් පත්‍රයේ පිටපතක් තමා භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) විභාගයට අදාල වන ප්‍රවේශ පත්‍ර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් අයදුම්කරුවන් වෙත යවනු ලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම තුළින් ඔබගේ සුදුසුකම් සනාථ කළ බව සැලකිල්ලට නොගත යුතුය.

4.4 විභාග ගාස්තු උතුරු මැද පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් පළාත් සභා ගිණුමට බැර වන ලෙස රු.720/-ක මුදලක් ගෙවා ලබා ගන්නා ලද NC – 100 ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත තීරුවේ නොගැලවෙන ලෙස අලවා තිබිය යුතුය. (ලදුපතේ පිටපතක් තමා භාරයේ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) කිසිම හේතුවක් නිසා වත් ගෙවන ලද විභාග ගාස්තු ආපසු නොගෙවනු ලබන බවත් එම ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරිමට ඉඩ නොදෙන බවත් සැලකිල්ලට ගත යුතුය.

4.5 ඉල්ලුම් පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු/ නීතීඥවරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරියෙකු/ පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් නිලධාරියෙකු හෝ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබිය යුතුය.

4.6 රාජ්‍ය සේවයේ හෝ පළාත් රජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

4.7 නිවරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.08.17 දිනට පෙර **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් පරිශ්‍රය, උතුරු මැද පළාත, අනුරාධපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම්පත් යොමු කරණ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ආදායම් පරික්ෂක III ශ්‍රේණියේ තනතුරු සඳහා විවෘත පදනමින් බඳවා ගැනීම - 2026** ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය.

4.8 තැපැල් කිරිමේදි අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

**05 විශේෂ අවධානය යොමු විය යුතු කරුණු :**

- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අයදුම්කරුවන් විසින් මෙම නිවේදනයේ දක්වා ඇති සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

- මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීමට කිසියම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණ වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද, යම් අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව සනාථ වුවහොත් ඔහුගේ / ඇයගේ පත්වීම අවලංගු කරනු ලැබේ.

- සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් ලැබීමේ ප්‍රමුඛතාවය හා සේවය කිරීමට කැමති ස්ථාන පිළිබඳව මනාප පදනම් කර ගනිමින් සේවා අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන පුරප්පාඩු සේවා ස්ථානය වෙත පත් කිරීම සිදු කරනු ලැබේ. සියලු අයදුම්කරුවන් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන පොදු නිති රීති හා කොන්දේසි අනුව කටයුතු කිරීමට බැඳි සිටී. සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම, ප්‍රතිඵල නිකුත් කිරීම, මුළු පුරප්පාඩු සංඛ්‍යාව හෝ ඉන් කොටසක් සම්පූර්ණ කිරීම, පත්වීම් ලබාදීම හා මෙම නිවේදනයෙන් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වන්නේය.

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.
2026.07.17

**ඇමුණුම 01**

**ආදායම් පරික්ෂක සේවයේ iii ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගයේ විෂය ධාරාව**

1. අපේක්ෂකයාගේ රාජකාරි කටයුතු සඳහා සුදුසුකම් හා හැකියාව පරික්ෂා කිරීම පිණිස සකස් කරනු ලබන විභාග ප්‍රශ්න පත්‍ර 02කින් යුක්ත වේ.

   1.1ලිඛිත විභාගය

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 02 භාෂා හැකියාව | පැය 01 | 100 | 40% |

2. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01 බුද්ධි පරීක්ෂණය | රාජකාරි සඳහා අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |
| 02 භාෂා හැකියාව | අක්ෂර වින්‍යාසය, වියරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳව අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |

සටහන - මෙම විභාගය තරඟ විභාගයක් වුව ද පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙන් සියයට හතලිහක් (40%) අපේක්ෂකයින් විසින් ලබාගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙන් සියයට පනහක් (50%) ලබාගත යුතු වේ. තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් පත්වීම් ලබාදෙනු ලැබේ.